**ශ්‍රී ලංකා රග්බි පාපන්දු සංගමය - 2017 වර්ෂය**

------------------------------------------------------

ශ්‍රී ලංකා රග්බි සංගමයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1993 අංක 47 දරන ක්‍රීඩා (සංශෝධිත) පනතේ 9 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සංගමයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණ කමිටුවේ වගකීම

--------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණ කමිටුවේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස ශ්‍රී ලංකා රග්බි හි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංගමයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 තත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රග්බි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තරඟ නීති රීති උල්ලංඝනය කිරීම සම්බන්ධව 2017 වර්ෂයේදී ජාත්‍යන්තර රග්බි සංගමය වෙතින් ශ්‍රී ලංකා රග්බි වෙත පනවා තිබූ දඩ මුදලින් 2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව පැවති රු. මිලියන 9 ක් අතුරින් රු. මිලියන 8 ක් මූල්‍ය ප්‍රකාශනවල දිගු කාලීන බැරකම් යටතේ දැක්විය යුතු වුවත් එය ජංගම බැරකම් යටතේ දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා රග්බි වෙත ක්‍රීඩා තරග වලට අදාළ විදේශ සංචාරයන් සඳහා රු. 11,318,090 ක් පිරිවැය වූ ගුවන් ටිකට්පත් ලබා දී තිබුණද එම වටිනාකම සංගමයේ ආදායම් හා වියදම් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ක්‍රීඩා උපකරණ හා ක්‍රීඩා සංවර්ධන කටයුතු වෙනුවෙන් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කරගත යුතු රු. 5,294,445 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) රග්බි ක්‍රීඩා සංවර්ධනය සඳහා පළාත් රග්බි සංගම් වෙත 2016 වර්ෂයේ ලබාදී තිබූ රු.1,358,962 ක හා 2017 වර්ෂයේ ලබාදී තිබූ රු. 1,750,000 ක අත්තිකාරම් නිරවුල් නොකිරීම හේතුවෙන් එම වර්ෂවල ක්‍රීඩා සංවර්ධන වියදම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) ලෝක රග්බි සංගමයෙන් 2016 වර්ෂය වෙනුවෙන් ලැබිය යුතුව තිබූ පවුම් 40,000 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී මුදල් ලැබී තිබීම හේතුවෙන් සිදු වූ විනිමය පාඩුව වූ රු. 596,085 ක් පෙර වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ අතිරික්තයෙන් අඩු කරනු වෙනුවට, සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුමට ගලපා තිබුණි.

(ඊ) ජාතික පාසල් කණ්ඩායම් ජාත්‍යන්තර රග්බි තරඟවලට සහභාගිවීම වෙනුවෙන් ශ්‍රී ලංකා රග්බි සංගමය විසින් 2016 වර්ෂයේදී වැය කර තිබූ රු. 17,492,313 ක් ශ්‍රී ලංකා පාසල් රග්බි සංගමයෙන් අයවිය යුතු ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. මෙම මුදල් පාසල් රග්බි සංගමයෙන් ගෙවන බවට ලිඛිත එකඟතාවයක් ලබා ගෙන නොමැති අතර, සංගමය වෙත අයවිය යුතු ලෙස සැලකීමට කිසිදු ලිඛිත තොරතුරක් සංගමයේ නොතිබුණි. මෙම මුදල් අයකර ගැනීම අවිනිශ්චිත බැවින් ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල කිසිදු ප්‍රතිපාදනයක් සිදු කර නොතිබුණි.

**2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

| | විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා පාසල් රග්බි සංගමය- ලැබිය යුතු ශේෂය | 17,492,313 | ශේෂ සනාථ කිරීම් |
| (ආ) | ගෙවිය යුතු ශේෂ | 3,107,747 | |
| (ඇ) | අවසාන තොගය | 4,229,913 | භෞතික තොග සමීක්ෂණ වාර්තා |

**2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

වර්ෂ 07 කට වඩා පැරණි, එකතුව රු.218,533 ක් වූ ලැබිය යුතු ශේෂ 04 ක් 2018 අප්‍රේල් 07 දින වනවිටද නිරවුල් කර ගෙන නොතිබුණි.

**2.2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

---------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

**නිරීක්ෂණය**

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| ශ්‍රී ලංකාවේ රග්බි ව්‍යවස්ථාවේ III කොටසේ 1 (b) ඡේදය | ජාත්‍යන්තර රග්බි කමිටුව විසින් කලින් කලට රග්බි ක්‍රීඩාව සම්බන්ධයෙන් පනවනු ලබන නීතිවලට අනුව ක්‍රියා කළ යුතු වුවද එකී නීති උල්ලංඝනය කර සුදුසුකම් නොමැති ෆිජී ජාතික ක්‍රීඩකයන් දෙදෙනෙකු තරඟ සඳහා යොදවා ගෙන තිබීම හේතුවෙන් ලෝක රග්බි සංගමය විසින් 2017 වර්ෂයේ සිට වසර 10 ක් තුළ ගෙවා නිම කළ යුතු ලෙස රු. මිලියන 10 ක (පවුම් 50,000) දඩ මුදලක් නියම කර තිබුණි. |

**2.2.5 නිෂ්කාර්ය තොග**

------------------

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන රු.4,229,913 ක් වූ අතැති තොගය තුළ ඇතුළත් රු. 103,368 ක් වූ වර්ග 9 කට අයත් ක්‍රීඩා උපකරණ හා ක්‍රීඩා ඇඳුම් 2013 වර්ෂයේ සිට නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය.

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංගමයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 14,559,671 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.5,694,619 ක් වීමෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 20,254,290 ක පිරිහීමක් ඇති වී තිබුණි. ආදායම් රු.6,311,854 කින් වැඩිවී තිබුණ ද පරිපාලන සහ අනෙකුත් මෙහෙයුම් වියදම් රු.28,071,269 ක් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලය පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

සංගමය සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටියක් හා අනුමත සේවක සංඛ්‍යාවක් නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

----------------------------------------

### 4.1 ක්‍රියාකාරී සැලැස්ම

---------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාර කාලපරිච්ඡේදය තුළ ළඟා කර ගත යුතු අරමුණු හා ඉලක්ක ඇතුළත් කර ක්‍රියාකාරී සැලැස්මක් 2017 වර්ෂය සඳහා පිළියෙල කර නොතිබුණි.

### 4.2 අභ්‍යන්තර විගණනය

-----------------------

මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව සංගමය සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංගමයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ වූ කරුණු |
|---|---|---|
| (අ) | වත්කම් කළමනාකරණය | මිලදී ගත් පරිභෝජන භාණ්ඩ තොග ලේඛනවල ඇතුළත් නොකිරීම. |
| (ආ) | ණයගැති හා ණයහිමි පාලනය | (i) ණයගැති ශේෂ සනාථන ලබා නොගැනීම.<br>(ii) අප්‍රමාදව ලැබිය යුතු හා ගෙවිය යුතු ණය ශේෂ නිරවුල් නොකිරීම. |

(ඇ) ගිණුම්කරණය

(i) ආදායම් නිවැරදිව ගිණුම්ගත නොකිරීම.
(ii) ස්ථාවර වත්කම් සඳහා ක්ෂය නිවැරදිව ගිණුම්ගත නොකිරීම.
(iii) කල්බදු වගකීම් ගිණුම් ගත නොකිරීම.
(iv) ජ’නල් සටහන් සඳහා අනුමැතිය නොමැති වීම.

(ඈ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය

(i) ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොමැති වීම.
(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය නොකිරීම.

(ඉ) අයවැය පාලනය

(i) ඇස්තමේන්තු ගත සංඛ්‍යා නිවැරදි නොවීම.
(ii) අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට හැකිවන පරිදි වර්ෂ ආරම්භයේදී අයවැය ඇස්තමේන්තු අනුමත නොකිරීම.